


# දිරිය දියණි

කවිමිණි මෙත්මා පැහැසරණි රන්කොත්ගදර

ISBN : 9786242084879

කෘතියේ නම : දිරිය දියණි

කතෘගේ නම : කවිමිණි මෙත්මා පැහැසරණි රන්කොත්ගදර

ශ්‍රේණිය : 7G

කතෘ අයිතිය ඇතුළු විස්තර : සියලුම හිමිකම් ඇවිරිණි

කෘතිය පල කරන දිනය : 08 - 02 - 2025

ISBN : 978624208359-9

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

සිතුමි පාසල් ඇරී ගෙදර ආවේ මැලවුණු මුහුණකිනි. ඇගේ අම්මා පළිඟු මැණිකා මිදුල අතු ගගා සිටියේ හරිම සතුටිනි. හැබැයි ඉතින් දූගේ පරවුණු මූණ දැක්කම ඇගේ මූණත් ටිකක් මැළවුණා.

''මොකෝ දූ මේ මූණ එල්ලගෙන'' ඇය ඇසුවාය.

''හ්ම්ම්. ඉස්කෝලේ ළමයි මට හිනාවෙනවා''

''ඇයි දූ එයාලා මොනාද කියන්නේ''

''එයාලා කියනවා මට තියෙන්නේ එකම යුනිෆෝර්ම් එක කියලා. ආයේ කැත අක්කා කෙනෙක් ඉන්නවා කියලත් කීවා'' ඇය අඬමින් කීවාය.

''අනේ දූ ඒවා ගණන් ගන්නේ කවුද? අනික ඔයාගේ අක්කා කැත වුණේ එක එයාගේ වරද නෙමෙයිනේ. මගේ දුව ගිහින් මූණ කට හෝදාගෙන එන්නකෝ. මම කෑම ලෑස්ති කරන්නම්''

පළිඟු මැණිකා ගෙදර ආදායම පිරිමහ ගත්තේ ඇගේ නිවසට යාබදව තිබුණු ජයන්තිගේ ගෙදර වැඩට යාමෙනි. ඇගේ සැමියා අන්තරා වී දැනට අවුරුදු 2 ක් පමණ වේ.

එදා උදේ පාන්දර නැගිටලා කිරිබත් උයලා ළමයි

දෙන්නව ඉස්කෝලේ යැව්වා.

14 හැවිරිදි සේදනි 9 හැවිරිදි සිතුමිගේ අක්කා විය. ඇය ඉගෙනීමට දක්ෂ නමුත් ඇය පාසලේ කොන් වී සිටින්නේ ඇගේ පෙනුම නිසයි. දෙදෙනාම යන්නේ ගමේ ඉස්කෝලෙට. ටවුමේ ඉස්කෝලෙට යවන්න පළිඟු මැණිකාට වත්කමක් තිබුණේ නැත.

ඉතින් ඊට පස්සේ එයාලව ඉස්කෝලේ යවලා ජයන්තිගේ ගෙදර වැඩට ගියාය. ජයන්තිගේ වෘත්තිය දොස්තරය. නමුත් ගුණයහපත්කම් වලින් නම් බාලය. ඇගේ සැමියා සරත් ඉංජිනේරු වෘත්තියේ යෙදෙයි.

ඇය පිඟානක් සෝද සෝදා ඉද්දී පිඟාන ඇය අතින් ලිස්සුවා. ඇය මොර දෙන සද්දේ ඇහිලා ජයන්ති දුවන් ආවා. ''අයියෝ අදත් කැඩුවද ඔයාලා වගේ සර්වන්ට්ලා ගන්නවට වඩා හොඳයි යක්කු බැඳගෙන වැඩ කරනවා නම්. දැන් ඉතින් අස් කරනවා'' ජයන්ති සැර දැම්මායී

පළිඟු මැණිකා අඩ අඩ අස් කලාය. ඉන් පසු ගේට්ටුව ඇරෙන සද්දය ඇසිණි. සේදනි ගේට්ටුව දෙසින් මතුවුණා.

''ආ. පළිඟු මැණිකා උඹ ඒ පාර ළමයිනුත් මෙහෙට ගෙන්න ගන්නව ද?'' ජයන්ති ඇහුවා

''අ..අ.. අනේ නෑ නෝනා. මට මේ ළමයිව ගෙදර තනියම

තියලා එන්න බැහැ'' ඈ බැගෑපත්ව කීවා.
''හරි එහෙනම් මේ ළමයව තණකොළ ගලවන්න තියාගන්නම්'' පළිඟු මැණිකා උඹ පලයන් උයන ගෙට. කෙල්ල එනවා මාත් එක්ක. ගිහිල්ලා ටැංකියෙන් නාලා වරෙන් පරණ බේබිගේ ඇඳුමක් තියෙනවා. ඒක ඇදගෙන තණකොළ ගලවපන්''

සේදනි මුහුණ සෝදාගෙන දුකින් බේබිගේ ඇදුමක් ඇඳගෙන තණකොළ ගැලෙව්වාය. සේදනීට හොඳටමබ ඩගිනියි. ඒත් ගැලෙව්වාය.

## අතීතයට නැවතත්

එදා නා කපන වැස්සක්. පළිඟු මැණිකා තම දරුවන් දෙදෙනාව අර කටුමැටි ගෙයි උගන්ව උගන්ව ඉද්දී ඇගේ සැමියා බණ්ඩා දොරට තට්ටු කළේය.

''හපෝ අර මනුස්සයා මේ මහ රෑ ඇවිත් තියෙන්නේ අදත් බීලාද කොහෙද''

''පළිඟු මැණිකෝ දොර ඇරපන්කෝ''

''අනේ මේ පිස්සුද? මේ මහ රෑ මට දොර අරින්න බෑ''

''මොකක්ද හොඳ හිතින් කියන්නේ අරිනවා දොර''

පළිඟු මැණිකා දොර ඇරියා පමණයි වීදුරු බෝතලයෙන් ඇගේ මුහුණට ප්‍රබල පහරක් එල්ල විය.

''මොනාද බං කන්න තියෙන්නේ. මට බඩගිනියි''
''ආ ඇයි මෙයා මෙතන වැටිලා''

ඔහු පළිඟු මැණිකා දෙස බලා ඇසුවාය.

''කෙල්ලේ මට මොනවහරි උයලා ගනින්'' දැන් හරි වැඩේ සේදනී උයන්න දන්නේ නැත. සිතුම් හැංගිලා හිටියේ අට්ටාල කාමරයේය.

''අ... අ... අනේ තාත්තේ මම උයන්න දන්නේ නෑනේ''

''අනේ ඉතින් ඔයත් අම්මා වගේමයි. කිසි දෙයක් බෑ මෝඩි'' කියා සේදනීව තල්ලු කරා.

''බලපන් උඹේ මූණේ හැටි''

එවිටම කොහෙදෝ සිට ආ පොළඟෙක් ඔහුව සපා කෑවේය.

ඔහු කෙළින්ම පළිඟු මැණිකාගේ ඇඟ උඩට වැටුණේය.
''අම්මේ තාත්තේ''

ඉන්පසු සේදනී ඉක්මණින් සිතුම්වත් ඔසවාගෙන එළියට දිව්වාය. ඇය හා සිතුම් ගෙයි පිළේම නිදා ගත්තෝය. හිරු එළිය මුළු ගේම සිපගත්තේය. සේදනීට

ඇහැරුණාය. ඇයට පෙර දිනයේ වූ සංසිද්ධිය මතක් වෙලා සිතුම්වත් බදාගෙන හොඳටම ඇඩුවාය. ඇය ඇස් ඇර බලද්දී සුදෝවතින් සැරසුණු මිනිසුන් පිරිලා හිටියේ ඇගේ ගේ මිදුල වටේය. ඇය කලබලයෙන් කුස්සියට ගොස් බලද්දී පළිඟු මැණිකා පොල් ගාමින් සිටියාය

''ඇයි අම්මේ මේ මොකද වෙන්නේ''

''අනේ දුවේ ඊයේ තාත්තා මළානේ''

ඇය එහෙම කීවේ ඉකිබිඳිමිනි. බණ්ඩාගේ අවසන් කටයුතු ඉවර කළ ඔවුන් ඉස්කෝලේ ගියා.

ටිලිං ටිලිං ටිලිං ටිලිං ඒ විවේක සීනුවයි. සේදනී කෑම පෙට්ටිය අරිද්දී එහි තිබුණේ බත් සහ ලුණු පමණි. එය දැකපු මේදානී බත් එක අරන් පොළොවේ ගැහුවා. ''හා හා හා කෑම එකවත් හරියට ගේන්න දන්නෑ බලනවකෝ අපේ කෑම එකේ ලස්සන''

''ඊයා හලෝ ඔයාට ලැජ්ජා නැද්ද ලුණුයි, බතුයි ගේන්න මෝඩි'' හංසි කීවා.

සේදනී අඬ අඬ කුණු අස් කරා.

''ඔයා කොහොමත් ඉතින් වැඩකාර කෙල්ලනේ'' දීපිකා
''අනේ ඇයි ඔයාලා මට මෙහෙම කරන්නේ''

''අපි කැමති නෑ දුප්පත් ළමයෙක් නිසා අපේ පංතිය කැත වෙනවාට'' සිතුලි කීවාය.

එවිටම අනූෂා මිස් පංතියට ආවාය.

''ළමයි ඔයාලා හැමෝම දන්නවා හෙට ඔයාලාගේ වාර විභාගය ආරම්භ වෙනවා. දැන් ගියවාරේ පළවෙනියා සේදනීනේ. අන්න ඔයගොල්ලොත් එයාව ආදර්ශයට ගන්න''

''මිස් මිස් එයාව කොහොමද අපි ආදර්ශයට ගන්නේ එයා මහ ගොඩේනේ'' දර්ශනී කීවාය.

''යනවා යන්න පංතියෙන් එළියට මෝඩී'' ගුරුතුමිය කීවාය.

''එහෙනම් ළමයි ඔයාලට මගෙන් විභාගය ලැබෙන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ආයුබෝවන්''

''ආයුබෝවන් මිස්''

සේදනී පාලම දිගේ පැල්කොටේ දෙසට හැරුණි.

''ආ ආ අර බලනවකෝ දීපිකා සේදනීට තියෙන ගෙදර චික්. එකේ හැටි විතරක්'' දර්ශනී කීවාය.

''හාපෝ''

දීපිකා සේදනීට ගලක් රැගෙන ගැසුවාය. ඒ ගහපු පාරින් සේදනී ඇළට වැටුණාය.

''දුවමු දුවමු සේදනී ඇළට වැටුණේ'' දර්ශනී කීවාය.

''ඔව් ඔව් යං''

''ඒයි කෙල්ලේ මොකද උඹ තණකොළ ගලවනවාද'' ඒ හඬින් සේදනී සිහින ලොවින් මිදුණි.

''ආ මේ ගලවනවා''

ප්‍රතිඵලය
ටිලිං ටිලිං ටිලිං
''ආ හරි දැන් ඉන්ටර්වල් ඉවරයි. ඔයාලා මීට සතියකට කලින් ලියපු බුද්ධාගම පේපරයේ ලකුණු අරගෙන මම ආවේ''
''හරි සිතුලි 75%
දීපිකා 52%
දර්ශනී 32%
මේදානී 45%
සේදනී 100%
මිනුදි 92%
නිශිනි 100%
''සේදිනි මම ඔයාටයි නිශිනිටයි දෙන්නටම සුබ පතනවා. ඒ වගේම දර්ශනී තව හොඳට ලකුණු ගන්න''

ඉන්පසු දීපිකාට දර්ශනී කිව්වා
''හපෝ හපෝ මෙදා සැරේ නම් අර මෝඩයා කොපි කරලා ඈ''
''ඔව් ඔව් මටත් තේරෙනවා''
''අම්මේ අම්මේ මට බුද්ධාගමට ලකුණු 100 න් 100''
''ෂා ෂා නියමයිනේ. තාත්තා හිටියනම් ගොඩක් සතුටු වෙයි''



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

---

## කවිමිණි මෙත්මා පැහැසරණි රන්කොත්ගදර

ISBN : 9786242084879

---